*PRAVACANA: The Journal of Bhiksu University of Sri Lanka, Vol. 16-Iss. II, Dec. 2025, 56-69.*
DOI: https://doi.org/10.4038/p.v16i2.71

# A Morphological Study of the Conditional Verb Forms in the Sigiri Poems

**[සීගිරි පද්‍යවල යෙදෙන අසම්භාව්‍ය ක්‍රියා පද පිළිබඳ පදිම විචාරාත්මක අධ්‍යයනයක්]**

**Indika Munaweera[1]**
**Vindhya Weerawardhana[2]**

## Abstract

The Sigiri poems are a highly valuable source in Sinhala literature. These poems were composed by various individuals who visited Sigiriya from different regions during the 8th, 9th, and 10th centuries AD. It is noteworthy that these inscriptions display linguistic features typical of the Middle Sinhala period, as well as elements that reflect earlier stages of the language. The primary objective of this study is to examine the verb forms of the conditional mood that fall under transitive verbs found in the Sigiri poems. Accordingly, the research problem focuses on analysing the structural patterns of these conditional mood verbs in the Sigiri graffiti. A qualitative research methodology was employed, with Sigiri Graffiti compiled by Senarath Paranavitana (1956) serving as the principal secondary source. In addition, relevant works on the Sinhala language and grammar, linguistic theory, research papers, and academic journals were consulted to establish the necessary theoretical framework. The data extracted from secondary sources were analysed through morphological theories in linguistics. The data were categorised under several aspects: identifying the verb roots of the conditional mood, examining phonemic alternations within those roots, analysing verbs formed through the combination of suffixes and prepositions, and identifying other distinctive features of conditional mood verbs. Through this process, the study explored the special uses of suffixes and the extent to which these forms have evolved into those used in modern Sinhala. The findings of this research make a significant contribution to understanding the structure of conditional mood verbs in the Sigiri corpus, the nature of contemporary Sinhala verb forms, and the evolutionary development of the Sinhala language. It can be concluded that the conditional mood verbs used in Sinhala during this period exhibit several distinctive linguistic characteristics.

**Keywords**: Conditional Mood, Linguistics, Morphology, Sigiri poems, Transitive verbs

1. Department of Linguistics, University of Kelaniya, Sri Lanka
E-mail: indikamunaweera13@gmail.com https://orcid.org/0009-0007-9427-7279
2. Department of Linguistics, University of Kelaniya, Sri Lanka
E-mail: vindhya@kln.ac.lk https://orcid.org/0009-0000-3093-2288

Received: 14 June 2025, Accepted revised version: 17 November 2025.
This work is licensed under a Creative Commons Attribution-Share A like 4.0 International License.

**සාරසංක්ෂේපය**

සිංහල සාහිත්‍යයෙහි එන ඉතා වටිනා ලිඛිත මූලාශ්‍රය විශේෂයක් ලෙස සීගිරි ගී දැක්විය හැකිය. ක්‍රි.ව. 8, 9, 10 යන සියවස්වල සීගිරිය නැරඹීමට නන්දෙසින් පැමිණි විවිධ පිරිස් මේ පද්‍ය රචනා කොට ඇත. මෙම ලිඛිත සටහන් තුළ මධ්‍ය සිංහල අවධියට අයත් භාෂා ලක්ෂණ මෙන්ම ඊට පූර්ව අවධීන් නියෝජනය වන භාෂා ලක්ෂණ ද ශේෂ ව පැවතීම විශේෂත්වයකි. මෙම පර්යේෂණයෙහි මූලික අරමුණ වනුයේ සීගිරි පද්‍යවල සඳහන් අසමාපක ක්‍රියා යටතට ගැනෙන අසම්භාව්‍ය ක්‍රියා පදවල පදිම සංස්ථිතිය පිළිබඳ විමර්ශනයක යෙදීමයි. ඒ අනුව මෙහි පර්යේෂණ ගැටලුව වනුයේ සීගිරි පද්‍යවල යෙදෙන අසම්භාව්‍ය ක්‍රියා පදවල පදිම සංස්ථිතියෙහි ස්වරූපය කෙබඳු ද යන්නයි. පර්යේෂණයෙහි ක්‍රමවේදය ලෙස ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යොදා ගනිමින් සෙනරත් පරණවිතාන (1956) විසින් රචිත සීගිරි ග්‍රැෆිටි කෘතිය ද්විතීයික මූලාශ්‍රය වශයෙන් භාවිත කරන ලදි. මීට අමතරව පර්යේෂණය සඳහා අවැසි න්‍යායාත්මක දැනුම උදෙසා සිංහල භාෂාව, සිංහල ව්‍යාකරණය, වාග්විද්‍යාත්මක සිද්ධාන්ත ඇතුළත් කෘති, පර්යේෂණ පත්‍රිකා, ශාස්ත්‍රීය සඟරා යනාදිය ද මූලාශ්‍රය වශයෙන් භාවිත කෙරිණි. ද්විතීයික මූලාශ්‍රය භාවිතයෙන් පර්යේෂණය සඳහා අවැසි දත්ත සම්පාදනය කරගනිමින් වාග්විද්‍යාවේ පැනෙන පදිම විචාරාත්මක සිද්ධාන්ත අනුසාරයෙන් දත්ත ගොණුව විශ්ලේෂණය කිරීම සිදු කෙරිණි. ඒ අනුව අසම්භාව්‍ය ක්‍රියා පදවල ක්‍රියා ප්‍රකෘති වෙන්කර ගැනීමත්, ක්‍රියා ප්‍රකෘතිවල සිදුව ඇති ශබ්දිම විකල්පන හඳුනා ගැනීමත්, අපර සර්ග බද්ධ වීමෙන් ක්‍රමිකව සාධනය වී ඇති අසම්භාව්‍ය ක්‍රියා පද හා නිපාත පද යෝගයෙන් අසම්භාව්‍ය ක්‍රියාර්ථ ප්‍රකාශ කරන ක්‍රියා පද හඳුනා ගැනීමත්, වෙනත් විශේෂතා සහිත අසම්භාව්‍ය ක්‍රියා පද හඳුනා ගැනීමත් යනුවෙන් අංශ කිහිපයක් යටතේ දත්ත වර්ගීකරණය සිදු කෙරිණි. එමගින් අපර සර්ග යෙදීමේ විශේෂතා, නූතන සිංහල වහර දක්වා ඒවා කොතෙක් දුරට පරිණාමයට පත්ව තිබේ ද යන්නත් විමර්ශනය කෙරිණි. සීගිරි පද්‍යවල සඳහන් අසම්භාව්‍ය ක්‍රියා පදවල සංස්ථිතිය පිළිබඳ ප්‍රාමාණික දැනුමක් ලබා ගැනීමටත්, තත් කාලීන සිංහල භාෂාවේ ස්වරූපය හඳුනා ගැනීමටත්, සිංහල භාෂාවේ පරිණාමීය ලක්ෂණ හඳුනා ගැනීමටත් හැකි වීමෙහිලා මෙම අධ්‍යයනය අතිශයින් වැදගත් වේ. මින් නිගමනය කළ හැකි කරුණ නම් ප්‍රස්තුත යුගවල සිංහල භාෂාවේ භාවිත අසම්භාව්‍ය ක්‍රියා පද ඊටම ආවේණික ලක්ෂණ රැසකින් යුක්ත වන බවයි.

**ප්‍රමුඛ පද:** අසමාපක ක්‍රියාපද, අසම්භාව්‍ය ක්‍රියාව, වාග්විද්‍යාව, පදිම විචාරය, සීගිරි පද්‍යය

## 1. හැඳින්වීම

ක්‍රි.ව. 7 සහ 8 සියවස් කාලය තුළ ආරම්භ වී ක්‍රි.ව. 13 වන සියවසෙහි මැද භාගය දක්වා වූ කාලය සිංහලයේ මධ්‍යතන යුගය වශයෙන් සැලකෙයි. සිංහල භාෂාවේ පරිණාමය සම්බන්ධයෙන් ඉතා විශාල පරිණාමීය ලක්ෂණ රැසකින් යුක්ත කාල වකවානුවක් ලෙස මෙම අවධිය නම්කළ හැකිය. මෙම අවධිය සිංහල භාෂා විෂයෙහි වැදගත් වනුයේ ප්‍රාකෘත භාෂා ලක්ෂණවලින් ඉවත් වෙමින් සිංහල භාෂාවට විශේෂ ලක්ෂණ රැ සක් එකතු වූ සංක්‍රමණික අවස්ථාවක් ලෙස ය (පේමානන්ද, 2004). මෙම අවධියෙහි භාෂා ලක්ෂණ පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී ඉතා වැදගත් මූලාශ්‍රයක් ලෙස සීගිරි පද්‍ය දැක්විය හැකිය.

ක්‍රි. ව. 8, 9, 10 යන ශතවර්ෂවලට අයත් සිංහල භාෂාව පිළිබඳ අධ්‍යයනය කිරීමේදී සීගිරි කැටපත් පවුරේ ලියා ඇති සීගිරි පද්‍ය ඉතා වැදගත් තැනක් ගනී. මෙකී යුගවල දී සීගිරි පර්වතයට නැගුණු ඇතැම් රසඥයෝ එහි බිත්තියෙහි සිත්තම් කොට තිබූ කතුන්

හා අවට පරිසරය බලා තම මනෝභාවයෙහි පහළ වූ අදහස් පද්‍යයට නගමින් ගී ලියූහ. ඒ අනුව සිංහල බසින් රචිත පද්‍ය 685ක් පමණ ඇති බව හඳුනාගෙන තිබේ (මුදියන්සේ, 2004). මෙම පද්‍ය දෙස අවධානය යොමු කිරීමේ දී ඒවායෙහි භාෂා ශෛලිය, වාක්කෝෂය හා ව්‍යාකරණ ලක්ෂණ අතින් ඉතා වැදගත් තොරතුරු රාශියක් අනාවරණය කොටගෙන තිබේ. විශේෂයෙන් බොහෝ විද්වතුන් අනුමාන කරන පරිදි මෙම සීගිරි පද්‍ය එම යුගවල දී ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල සිට එය නැරඹීම සඳහා පැමිණි පුද්ගලයන් විසින් රචනා කොට තිබීමත්, එම යුගවල දී විවිධ ප්‍රදේශවල භාවිත වූ ව්‍යවහාරිත සිංහල භාෂාවේ ස්වරූපය මැනවින් ප්‍රකට වීමත්, වර්තමානය වන විට එම භාෂා ලක්ෂණ එලෙසින්ම සීගිරි පද්‍ය තුළ ශේෂව පැවතීමත් නිසා මෙම සාහිත්‍ය අංගය ඉතා විශේෂ වේ.

## 2. සාහිත්‍ය විමර්ශනය

සමකාලීන සාහිත්‍ය දෙස අවධානය යොමු කිරීමේ දී ආගමික සාහිත්‍ය පදනම් කොටගෙන පොතපත රචනා වී ඇති අතර සීගිරි කුරුටු ගී විවිධ පැතිකඩ නියෝජනය වන සාහිත්‍ය අංගයක් වශයෙන් ඉතා වැදගත් ය. සීගිරි පද්‍ය තුළ අන්තර්ගත භාෂාව එවකට පැවති ජන සාහිත්‍ය, ජන විඥානය හා ජන සමාජය අධ්‍යයනය කිරීමෙහිලා ද අතිශයින් වැදගත් ලේඛන වාර්තාවක් ලෙස පෙන්වාදිය හැකිය. එකල සිංහල භාෂාවේ ව්‍යවහාර වූ නාම පද, ක්‍රියා පද හා නිපාත පද යනාදි භාෂාත්මක ලක්ෂණ රාශියක් අන්තර්ගත ලේඛන වාර්තා විශේෂයක් වශයෙනුත්, වාග්විද්‍යාත්මක විමර්ශනයක් සඳහා අවැසි තොරතුරු රාශියක් අන්තර්ගතව ඇති ලිඛිත මූලාශ්‍රයක් වශයෙනුත් මෙම මූලාශ්‍රයන් තුළ ඇති වටිනාකම අති මහත් ය. ඒ අනුව පූර්වෝක්ත යුගවල දී සිංහල භාෂාවේ ක්‍රියාපදයේ සංස්ථිතිය පිළිබඳ බොහෝ තොරතුරු විමර්ශනය කරගත හැකි අතර මෙම පර්යේෂණයේ දී සීගිරි ගීවල සඳහන් අසම්භාව්‍ය ක්‍රියාව පිළිබඳ පදිම විචාරාත්මක අධ්‍යයනයක් සිදු කෙරේ.

සිදත් සඟරා කතුවරයා ක්‍රියාව යන්න දක්වා ඇත්තේ "නොදැව් නුගුණ දැව් නිසා සකරුණෙන් දා මුව මැ සිදු කිරිය නම්" යන්නයි (ධර්මාරාම, 1947). මෙම නිර්වචනයට අනුව ක්‍රියාපද පිළිබඳ ලක්ෂණ පහක් හඳුනාගත හැකි බව ජේ.බී. දිසානායක දක්වා ඇත. එනම්,

ක්‍රියාව යනු ද්‍රව්‍යයක් නොවේ. (නොදැව්)

ක්‍රියාව යනු ගුණයක් නොවේ. (නුගුණ)

ක්‍රියාව ද්‍රව්‍ය නිසා සිදු වේ. (දැව් නිසා)

ක්‍රියාව කාරක හයක් හා සම්බන්ධ වේ. (සකරුණෙන්)

ක්‍රියාව ධාතු පාදක කොට සිදු වේ. (දාමුව වැ) (දිසානායක, 2001)

මේ ලක්ෂණ අනුව ක්‍රියාපදයක් යනු කුමක්ද යන්න මනාව හඳුනාගත හැකිය.

වාක්‍යයක ආඛ්‍යාත ස්ථානයෙහි යෙදෙන, ධාතු මූලික වූ කේන්ද්‍රීය පදය ක්‍රියාපදය වන බව ඩබ්.එස්. කරුණාතිලක (2014) දක්වයි. ලිඛිත සිංහලයෙහි ක්‍රියා ධාතු පුරුෂ, වචන හා කාල යන ව්‍යාකරණ ලක්ෂණ සඳහා වරනැගේ. ක්‍රියාපද වරනැගීමේ දී ඒවා සමාපක ක්‍රියා හා අසමාපක ක්‍රියා යනුවෙන් ප්‍රධාන වශයෙන් වර්ග කළ හැක. එනම්, වාක්‍යාර්ථය සමාප්ත වන ක්‍රියාපද සමාපක ක්‍රියාපද වන අතර, වාක්‍යාර්ථය සමාප්තියට පත් නොවන ක්‍රියා අසමාපක ක්‍රියා වේ. මෙහිදී අසම්භාව්‍ය ක්‍රියාව අසමාපක ක්‍රියා යටතට ගැනෙනුයේ මින් වාක්‍යාර්ථය සමාප්තියට පත් නොවන බැවිනි. (කරුණාතිලක, 2014).

ක්‍රියා ධාතුවෙන් හෝ ක්‍රියා ශබ්දයෙන් පරව -ත්, -ත යෙදීම, ඉකාරාන්ත ක්‍රියාවල ඉකාරය විකල්පයෙන් -උ වීම, අතීත

කෘදන්ත ශබ්දයට -අ ප්‍රත්‍යය යෙදීම, ශක්‍යාර්ථ (-ඉය) කෘදන්තයට -දී නිපාතය යෙදීම, -ත ප්‍රත්‍යාන්ත අසම්භාව්‍ය ක්‍රියා රූපයට -ත්, -ද, -දු නිපාත යෙදීම, අතීත කෘදන්ත සමඟ හොත්, ඔත් නිපාත යෙදීම, හොත්/ ඔත් වලින් පරව -ඉන්, -ඉනි ප්‍රත්‍යය යෙදීම යනාදී ක්‍රම ඔස්සේ අසම්භාව්‍ය ක්‍රියා පද සාධනය වේ. මෙහි අසම්භාව්‍ය ක්‍රියාව කාලාර්ථය හා අනියමාර්ථය වශයෙන් ප්‍රභේද දෙකකි. (කරුණාතිලක, 2014).

කුමාරතුංග මුනිදාස (2022) ක්‍රියා විවරණයෙහි අසම්භාව්‍ය ක්‍රියාව යන්න ආවස්ථික නිපාත ක්‍රියා යනුවෙන් නිපාත ක්‍රියා යටතේ දක්වා තිබේ. එහි නිපාත ක්‍රියා යන්න දක්වනුයේ "ක්‍රියාර්ථයකින් යුක්ත වූයේ නිපාත ක්‍රියා නම්" ලෙසයි. එනම් එක් ක්‍රියාවකට විශේෂණ ව සිටින අප්‍රධාන ක්‍රියාපද නිපාත ක්‍රියා ලෙස හැඳින්විය හැකිය. කෘදන්ත නිපාත යන්න ද මීටම නමකි. මෙහි අසම්භාව්‍ය ක්‍රියාව සැකසෙන ආකාර කිහිපයකි. එනම්, -තු ප්‍රත්‍යය යෙදීම (බලතු, බමතු), -තු ප්‍රත්‍යයෙහි ස්වරය ලොප් වීම හා අකාරාගමය (බලත්, බමත්, බලත, බමත), -අ ප්‍රත්‍යය පර කල්හි ධාතුව අතීත ප්‍රථම පුරුෂ බහුවචන ආඛ්‍යාත රූපය ගැනීම (නැඟිය, රැකිය), -ඉය ප්‍රත්‍යය පර කල්හි ධාතු ස්වරය ස්වර පූර්වීකරණයට ලක් වීම (බැලියැ, රැකියැ) ආදී ක්‍රම ඔස්සේ සිංහල භාෂාවේ අසම්භාව්‍ය ක්‍රියාව සකස් වේ. මෙහි ආවස්ථික ක්‍රියාවෙහි නියම හා අනියම වශයෙන් ක්‍රියා අර්ථ දෙකකි. (මුනිදාස, 2022).

සමකාලීන කෘතිවල සඳහන් අසම්භාව්‍ය ක්‍රියාපද සම්බන්ධයෙන් සිදුව ඇති පර්යේෂණ පිළිබඳ විමර්ශනය කිරීමේ දී බුත්සරණෙහි ක්‍රියාපද පිළිබඳ වාග්විද්‍යාත්මක විග්‍රහයක් සිදු කරන වී.ඒ. වීරවර්ධන (2012) ක්‍රියාපද පිළිබඳ ගැඹුරු අධ්‍යයනයක නිරත වී ඇති අතර බුත්සරණෙහි යෙදුණු අසම්භාව්‍ය ක්‍රියා ප්‍රත්‍ය ලෙස -ත් ප්‍රත්‍යයත්, එය වර්තමාන කාල ක්‍රියාරූප සමඟ යෙදෙන බවත් සඳහන් කොට ඇත. එහිදී අතීත කාල ක්‍රියාරූප සමඟ හොත් නිපාතය යෙදෙන බවත් මෙම ක්‍රියා පදවල කාල, පුරුෂ හා වචන භේදයක් නොදක්වන බවත් සඳහන්ය.

අමාවතුරෙහි ක්‍රියාපද පිළිබඳ පදිම විග්‍රහයක් සිදු කරන විල්පත ධම්මසේන හිමි (1982) වර්තමාන ක්‍රියා ශබ්දයෙන් පරව -ත් ප්‍රත්‍යය හා අතීත ක්‍රියා ශබ්දයෙන් පරව හොත් නිපාතය යෙදීමෙන් අසම්භාව්‍ය ක්‍රියාව සෑදෙන බව දක්වයි. අසම්භාව්‍ය අර්ථයෙහි යෙදෙන -ත් ප්‍රත්‍යයෙහි වෛකල්පිත ප්‍රත්‍යයක් වශයෙන් -ත යෙදෙන බවත්, -ත ප්‍රත්‍යය යෙදුනු කල එයින් පරව -(උ) දු / -(උ) ද් යන නිපාත යෙදී ඇති බව සඳහන් කරයි.

මේ ආකාරයෙන් සිංහල භාෂාවේ ක්‍රියාපද හා අසම්භාව්‍ය ක්‍රියා සම්බන්ධයෙන් බොහෝ විද්වතුන් විසින් තොරතුරු දක්වා ඇති ආකාරය ගවේෂණය කළ හැකිය. සීගිරි ගී තුළින් හෙළිවන පැරණි සිංහල භාෂාවේ අසම්භාව්‍ය ක්‍රියාපද සම්බන්ධයෙන් ඇති පර්යේෂණ අන්තරය පූර්ණ කිරීම් වස් මෙම අධ්‍යයනය සිදු කරනු ලැබේ.

### 3. පර්යේෂණ ගැටලුව

ක්‍රි.ව. 8, 9, 10 යන සියවස්වල රචිත සීගිරි ගීවල යෙදෙන අසම්භාව්‍ය ක්‍රියා සම්බන්ධව පදිම විචාරාත්මකව අධ්‍යයනය කිරීම.

### 4. පර්යේෂණ අරමුණ

ක්‍රි.ව. 8, 9, 10 යන සියවස්වල රචිත සීගිරි පද්‍යවල යෙදෙන අසම්භාව්‍ය ක්‍රියාවේ ස්වරූපය හඳුනාගැනීම, ඒවායෙහි පදිම සංස්ථිතියෙහි ස්වරූපය අධ්‍යයනය කිරීම සහ තත් යුගයේ භාෂා ලක්ෂණ හඳුනාගැනීම.

### 5. පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය ඔස්සේ ද්විතීයික මූලාශ්‍රය ආශ්‍රයෙන් සිදු කරනු ලබන පර්යේෂණයකි.

සෙනරත් පරණවිතාන විසින් රචිත සීගිරි ග්‍රැෆිටි කෘති (ඡ්රබ්ඩසඡ්බ්, 1956) මෙහිලා ද්විතීයික මූලාශ්‍රය වශයෙන් යොදාගන්නා ලදි. න්‍යායාත්මක දැනුම ලබා ගැනීම උදෙසා වාග්විද්‍යාත්මක කෘති, සිංහල භාෂාව හා ව්‍යාකරණය සම්බන්ධ ග්‍රන්ථ පරිශීලනය කරමින් මෙම පර්යේෂණය සිදු කරන ලදි.

මෙහිදී සීගිරි පද්‍යවල සඳහන් ක්‍රියාපද ආශ්‍රයෙන් දත්ත සංහිතාවක් සකස් කර ගැනීම මූලිකව ම සිදු කෙරිණි. එම දත්ත සංහිතාවෙන් අසම්භාව්‍ය ක්‍රියාපද වෙන්කර ගැනීමත්, එම දත්ත ගොනුව පදිම විචාරාත්මක සිද්ධාන්ත අනුසාරයෙන් විශ්ලේෂණය කර ගැනීමත් සිදු විය. එහි දී අසම්භාව්‍ය ක්‍රියා පදවල ක්‍රියා ප්‍රකෘති වෙන්කර ගැනීමත්, ක්‍රියා ප්‍රකෘතිවල සිදුව ඇති ශබ්දිම විකල්පන හඳුනා ගැනීමත්, ප්‍රත්‍යය හෙවත් අපර සර්ග බද්ධ වීමෙන් ක්‍රමිකව සාධනය වී ඇති අසම්භාව්‍ය ක්‍රියා පද හඳුනා ගැනීමත්, එහිලා ක්‍රියා ප්‍රකෘති සමඟ බද්ධ වී ඇති අපර සර්ග හඳුනා ගැනීමත්, නිපාත පද හෙවත් වෙනත් උපපද ක්‍රියා ප්‍රකෘති සමඟ යෙදී අසම්භාව්‍ය ක්‍රියාර්ථ ප්‍රකාශ කරන පද හඳුනා ගැනීමත්, වෙනත් විශේෂතා සහිත අසම්භාව්‍ය ක්‍රියා පද හඳුනා ගැනීමත් යනුවෙන් ප්‍රධාන අංශ කිහිපයක් යටතේ මෙම නිරීක්ෂණය සිදු කෙරිණි. ඒ අනුව සීගිරි පද්‍යවල යෙදෙන අසම්භාව්‍ය ක්‍රියා පදවල සංස්ථිතික ලක්ෂණ විමර්ශනය කිරීමත්, සීගිරි පද්‍යවල යෙදෙන අසම්භාව්‍ය ක්‍රියා පදවල හඳුනාගත හැකි විශේෂතා පවතී ද යන්නත් විමර්ශනය කෙරිණි.

## 6. ප්‍රතිඵල හා සාකච්ඡාව

සීගිරි පද්‍යවල යෙදෙන අසම්භාව්‍ය ක්‍රියා පදවල සංස්ථිතිය පිළිබඳ විමසීමේ දී එවකට සිංහල භාෂාවේ භාවිත අසම්භාව්‍ය ක්‍රියාව සංස්ථිතික ලක්ෂණ අනුව පහත ආකාරයෙන් වර්ගීකරණය කළ හැකිය.

i. සර්ග භාවිතයෙන් සාධිත අසම්භාව්‍ය ක්‍රියා
ii. උපපද යෝගයෙන් සෑදෙන අසම්භාව්‍ය ක්‍රියා
iii. කෘදන්ත පද භාවිතය
iv. වෙනත් විශේෂතා

### 6.1 සර්ග භාවිතයෙන් සාධිත අසම්භාව්‍ය ක්‍රියා

සීගිරි පද්‍යවල අසම්භාව්‍ය ක්‍රියාව සඳහා සර්ග දෙකක් භාවිත වී ඇත. එනම්, -ත සහ -ත් යන සර්ග දෙකය. ක්‍රියා ධාතුවෙන් පරව මෙම සර්ග යෙදී ක්‍රමිකව අසම්භාව්‍ය ක්‍රියාපද සාධනය වී තිබේ. විවිධ වියතුන් අසම්භාව්‍ය ක්‍රියාව කාලාර්ථය හා අනියමාර්ථය වශයෙන් අර්ථ දෙකක් දක්වා ඇති බව මතු සඳහන් කෙරිණි. එම ආකාර දෙක අතුරින් මෙම අධ්‍යයනයේ දී සීගිරි පද්‍යවල බහුලව හමු වූයේ කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියායි. ඒ සඳහා උදාහරණ ලෙස පහත අසම්භාව්‍ය ක්‍රියා පද දැක්විය හැකිය.

| අසම්භාව්‍ය ක්‍රියා පදය | පදිම පිහිටීම | අර්ථය | පද්‍යය අංකය |
|---|---|---|---|
| බණවත | baɳə + wə + tə | කාලාර්ථය | 21, 71, 208 |
| බිණුවත් | biɳu: + wa + t | කාලාර්ථය | 39 |
| සිහිවත | sihi + wa + tə | කාලාර්ථය | 74, 451, 531 |
| සිතවත | sitə + wa + tə | කාලාර්ථය | 587 |
| වසවත | wasə + wə + tə | කාලාර්ථය | 370 |
| දහවත | daha + wə + tə | කාලාර්ථය | 682 |
| සිහිවත් | sihi + wa + t | කාලාර්ථය | 602 |
| තදවත | tadə + wə + tə | කාලාර්ථය | 598 |
| තරවත | tarə + wə + tə | කාලාර්ථය | 598 |

මෙහි දී ක්‍රියා ධාතුවෙන් පරව උක්ත සර්ග යෙදීමේ දී ක්‍රියා ධාතුවෙහි ස්වර ශබ්දිමවල පහත විකල්පනයන් හඳුනාගත හැකිය.

බණ බණ + ත

බ් + අ + ණ් + අ + ත

බ් + එ + ණ් + එ + ත (අ - එ වීම)

බෙණෙත

පු පු + ත්

ප් + උ + ය් + උ + ත්

පුයුත්

දප දප + ත්

ද් + අ + ප් + අ + ත්

ද් + ඇ + ප් + උ + ත්

දැපුත්

දක් දක් + උ + ත්

දකුත්

ධාතු ප්‍රකෘතියෙහි ස්වර පූර්වීකරණය වීමෙන් අනතුරුව ධාතු ප්‍රකෘතියට අසම්භාව්‍ය ක්‍රියා සර්ග එකතු වී තිබේ. එහි දී සිදුව ඇති ස්වර පූර්වීකරණ ඉහත නිදසුන් මගින් හඳුනාගත හැකිය.

- **-ද් සහ -ජ් එකතු වීම**

ක්‍රියා ධාතුවට පරව -ත සහ -ත් සර්ග යෙදීමේ දී -ත සර්ගයෙහි ඇති අන්ත -අ ස්වරය ලොප් වී -උ ස්වරය බවට පත්වනු ලැබේ. (ත් + අ + උ - තු) පසුව -තු යනුවෙන් සෑදෙන අතර ඊට පරව -ද් සහ -ජ් යනුවෙන් ප්‍රත්‍යය දෙකෙන් එකක් එකතු වේ. සීගිරි පද්‍යවල මෙම ලක්ෂණ දෙකින්ම යුක්ත අසම්භාව්‍ය ක්‍රියා පද හමුවේ.

බල බල + ත් + උ + (ද් / ජ්)
බලතුද් / බලතුජ් (පද්‍ය අංක - 496, 523)

බණ බණ + ත් + උ + (ද් / ජ්)
බණතුද්/බණතුජ්(පද්‍ය අංක - 568,683)

දක් දක් + ත් + උ + (ද් / ජ්)
දක්තුද් / දක්තුජ් (පද්‍ය අංක - 605)

වස වස + ත් + උ + (ද් / ජ්)
වසතුද් / වසතුජ් (පද්‍ය අංක - 22)

නූතන සිංහල භාෂාවේ මෙම ප්‍රත්‍යයවලට -ද්දී යන්න එකතුව බලද්දී, කියද්දී, නටද්දී වැනි කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා රූප සාධනය වී තිබේ. -ත් ප්‍රත්‍යාන්ත අසම්භාව්‍ය ක්‍රියාරූප සඳහා -දී නිපාතය යෙදී එහි -ත්දි ස -ද්දී බවට පත්වීමයි. එහි විකාශනය පහත ආකාරයෙන් දැක්විය හැකිය.

බලතුජ් > බලතුද් > බලත්දී > බලද්දී

වසතුජ් > වසතුද් > වසත්දී > වසද්දී

වර්තමාන සිංහලයෙහි ඉහත සඳහන් මුල් අවස්ථා තුනම අභාවයට ගොස් අවසාන රූපය පමණක් සිංහල භාෂාවේ ශේෂව පවතී. ඉහත මුල් අවස්ථා තුන සිංහල භාෂාවේ අවධි කිහිපයක සිංහල භාෂාවේ නියෝජනය වුවද එම අවස්ථා තුනම සීගිරි පද්‍යවල සඳහන් වීම විශේෂත්වයකි.

- **-ව යන ව්‍යුත්පන්න සර්ගය යෙදී -ත / -ත් ප්‍රත්‍යය යෙදීම**

සීගිරි පද්‍යවල අසම්භාව්‍ය ක්‍රියාව සඳහා -ත සහ -ත් සර්ග භාවිත වන තවත් විශේෂ අවස්ථාවක් වශයෙන් පහත අසම්භාව්‍ය ක්‍රියා පද දැක්විය හැකිය. මෙහිදී සිදුව ඇත්තේ ධාතු ප්‍රකෘතියත්, -ත/ -ත් සර්ගයන්ටත් අතරට -ව- යන ව්‍යුත්පන්න සර්ගයක් යෙදී අසම්භාව්‍ය ක්‍රියා රූපය සැකසීමයි.

## 6.2 උපපද යෝගයෙන් සෑදෙන අසම්භාව්‍ය ක්‍රියා

සීගිරි පද්‍යවල අසම්භාව්‍ය ක්‍රියාර්ථය හැඟවීම සඳහා ක්‍රියාරූපය සමඟ උපපද භාවිතය බහුලව දැකිය හැකි ලක්ෂණයකි. එම උපපද පහත ආකාරයෙන් දැක්විය හැකිය. වර්තමාන සිංහලයෙහි මෙම උපපද අතුරින් දැනට හොත්/ ඔත්/ සඳ/ කල/ කල්හි/ විට යනාදිය භාවිතයේ පවතී. අනෙක් ඒවා භාවිතයෙන් ක්‍රමයෙන් ඈත්වෙමින් පවතී. නූතන භාෂණ සිංහලයෙහි මේ අතුරින් බහුලව භාවිත වනුයේ -ඔත් යන උපපදයයි. එහෙත් මධ්‍ය කාලීන සිංහල යුගයේ දී මෙම උපපද සියල්ල අසම්භාව්‍ය ක්‍රියාර්ථ දැක්වීම සඳහා ලේඛන හා භාෂණ දෙකෙහිම භාවිත කොට ඇත.

- හොත / හොත්
- ඔත්
- මුත්
- සඳ / සන්ද / සැදැ / සැන්දැ / සන්දිහි
- කල / කල්හි
- වර
- විට
- නම්

| අසම්භාව්‍ය ක්‍රියා පදය | පදිම පිහිටීම | අර්ථය | පද්‍යය අංකය |
|---|---|---|---|
| බැලු සන්ද | bælu + sɑndə | කාලාර්ථය | 132 |
| දුට් සැදැ | duʈ + sædæ | කාලාර්ථය | 551, 575 |
| ආ සන්දිහි | ɑː + sɑndhi | කාලාර්ථය | 387 |
| ආ සඳ | ɑː + sɑd̃ə | කාලාර්ථය | 558 |
| ආ සැන්දැ | ɑː + sændæ | කාලාර්ථය | 671 |
| ආ සන්ද | ɑː + sɑndə | කාලාර්ථය | 685 |

■ හොත / හොත් යෙදීම ■ මුත් යෙදීම

| අසම්භාව්‍ය ක්‍රියා පදය | පදිම පිහිටීම | අර්ථය | පද්‍යය අංකය |
|---|---|---|---|
| කීහොත | ki: + hotə | අනියමාර්ථය | 265 |
| බලත හොත් | bɑlətə + hot | අනියමාර්ථය | 323 |
| ජතහොත් | ɟɑtə + hot | අනියමාර්ථය | 150 |
| ගියහොත | gijə + hotə | අනියමාර්ථය | 79, 122 |
| ගියහොත් | gijə + hot | අනියමාර්ථය | 288, 618 |
| මළහොත | mɑɭə + hotə | අනියමාර්ථය | 158 |
| නොමළහොත් | nomɑɭə + hot | අනියමාර්ථය | 634 |
| වසත්හොත් | wɑsət + hot | අනියමාර්ථය | 148 |

■ ඔත් යෙදීම

| අසම්භාව්‍ය ක්‍රියා පදය | පදිම පිහිටීම | අර්ථය | පද්‍යය අංකය |
|---|---|---|---|
| කිව ඔත් | kiwə + ot | අනියමාර්ථය | 505 |
| බැලුයොත් | bælu + j + ot | අනියමාර්ථය | 75 |
| දුටොත් | duʈ + ot | අනියමාර්ථය | 563 |

■ මුත් යෙදීම

| අසම්භාව්‍ය ක්‍රියා පදය | පදිම පිහිටීම | අර්ථය | පද්‍යය අංකය |
|---|---|---|---|
| බැලුම් මුත් | bælum + m + ot | කාලාර්ථය | 26 |

■ සඳ / සන්ද / සැදැ / සැන්දැ / සන්ද්හි යෙදීම

| අසම්භාව්‍ය ක්‍රියා පදය | පදිම පිහිටීම | අර්ථය | පද්‍යය අංකය |
|---|---|---|---|
| බැලු සන්ද | bælu + sɑndə | කාලාර්ථය | 132 |
| දුටි සැදැ | duʈ + sædæ | කාලාර්ථය | 551, 575 |
| ආ සන්ද්හි | ɑ: + sɑndhi | කාලාර්ථය | 387 |
| ආ සඳ | ɑ: + sɑd̃ə | කාලාර්ථය | 558 |
| ආ සැන්දැ | ɑ: + sændæ | කාලාර්ථය | 671 |
| ආ සන්ද | ɑ: + sɑndə | කාලාර්ථය | 685 |

- **කල / කල්හි යෙදී**

| අසම්භාව්‍ය ක්‍රියා පදය | පදිම පිහිටීම | අර්ථය | පද්‍යය අංකය |
|---|---|---|---|
| සිහිවන කල | sihiwənə + kɑlə | කාලාර්ථය | 5 |
| බැලූ කල | bælu + kɑlə | කාලාර්ථය | 547 |
| දුටු කල | duʈ + kɑlə | කාලාර්ථය | 553 |
| මළ කල්හි | mɑɭə + kɑlhi | කාලාර්ථය | 326 |

- වර යෙදීම

| අසම්භාව්‍ය ක්‍රියා පදය | පදිම පිහිටීම | අර්ථය | පද්‍යය අංකය |
|---|---|---|---|
| නැගි වර | nægi + wɑrə | කාලාර්ථය | 239 |

- විට යෙදීම

'

| අසම්භාව්‍ය ක්‍රියා පදය | පදිම පිහිටීම | අර්ථය | පද්‍යය අංකය |
|---|---|---|---|
|ආ විට | ɑ: + wiʈə | කාලාර්ථය | 70, 80 |

- නම් යෙදීම

| අසම්භාව්‍ය ක්‍රියා පදය | පදිම පිහිටීම | අර්ථය | පද්‍යය අංකය |
|---|---|---|---|
| අ නම් | ɑ: + nam | අනියමාර්ථය | 602 |

**6.3 කෘදන්ත පද භාවිතය**

සීගිරි පද්‍යය මගින් රැස්කර ගත් දත්ත අනුව එවකට සිංහල භාෂාවේ අසම්භාව්‍ය ක්‍රියාර්ථ දැක්වීම සඳහා කෘදන්ත පද බහුලව භාවිත කොට තිබේ. එම කෘදන්ත පද විවිධ සංස්ථිතික ලක්ෂණවලින් යුක්ත වන අතර නිදසුන් වශයෙන් සීගිරි පද්‍යවලින් ර‍ැ ස්කරගත් ක්‍රියා පද කිහිපයක් පහත පරිදි දැක්විය හැකිය.

| අසම්භාව්‍ය ක්‍රියා පදය | පද්ම පිහිටීම | අර්ථය | පද්‍යය අංකය |
|---|---|---|---|
| කියවි | kijə + wi | කාලාර්ථය | 495 |
| බැලුව | bælu + wə | කාලාර්ථය | 156 |
| බැලු | bɑlə > bælu | කාලාර්ථය | 614 |
| බුණ | buɳə | කාලාර්ථය | 39, 542 |
| ඔවි | e + wi | අනියමාර්ථය | 465 |
| එන | e + nə | කාලාර්ථය | 382, 560 |
| උව | ɑwə | කාලාර්ථය | 157, 459 |
| වැයිමෙ | wɑjə - wæjə + i + m + e | කාලාර්ථය | |
| උදායෙ | udɑ: + j + e | කාලාර්ථය | |

ඉහත දත්ත අනුව පැහැදිලි වනුයේ මෙම යුගයේ දී සිංහල භාෂාවේ අසම්භාව්‍ය ක්‍රියා අර්ථය දැක්වීම සඳහා කෘදන්ත පද භාවිතය ස්වරූප කිහිපයක් යටතේ සිදුව ඇති බවයි.

අතීත හා වර්තමාන කෘදන්ත පද අසම්භාව්‍ය ක්‍රියා අර්ථයෙහි යෙදී ඇත.

| | | | | |
|---|---|---|---|---|
| උදා - | √බල - | බැලු (අතීත කෘදන්ත) | - | බැලූ කල්හි |
| | √බණ - | බුණ (අතීත කෘදන්ත) | - | බිණූ කල්හි |
| | √එ - | අව (අතීත කෘදන්ත) | - | පැමිණි කල්හි |
| | √එ - | එවි (වර්තමාන කෘදන්ත) | - | එන කල්හි |
| | √එ - | එන (වර්තමාන කෘදන්ත) | - | එන කල්හි |

- -අ / -ඉ / -එ සර්ග යෙදීම

අතීත හා වර්තමාන කෘදන්ත ශබ්දයට පරව -අ සහ -ඉ සර්ග යෙදීමෙන් අසම්භාව්‍ය ක්‍රියා පද භාවිත වී තිබේ. එහි දී අතීත කෘදන්ත ශබ්දයත්, -අ සර්ගයත් අතරට -ව් සහ -ය් යන ව්‍යුත්පන්න සර්ග එකතු වනු ලැබේ.

උදා - √කි - කිය - කිය + ඉ

කිය + ව් + ඉ

කියවි (කියන කල්හි)

√බල - බැලු - බැලු + අ

බැලු + ව් + අ

බැලුව (බැලූ කල්හි)

√වය - වැය - වැය + එ

වැය් + අ + ම් + එ

වැය් + ඉ + ම් + එ

වැයිමේ (වැයීම කරන කල)

√උදා - උදා - උදා + එ

උදා + ය් + එ

උදායෙ (උදාවන කල්හි)

### 6.4 වෙනත් විශේෂ පද භාවිතය

අතීත කෘදන්ත පද අග ඇති -අ ශබ්දිමය -එන් ශබ්දිමය බවට පත්ව අසම්භාව්‍ය ක්‍රියා පද සෑදී තිබේ.

| | | |
|---|---|---|
| බල | බැලු / බැලුව | බැලු + ව් + අ |
| | | බැලු + ව් + එන් |
| | | බැලුවෙන් (බැලූ කල) |
| දක් | දුටු / දුට් / දුටුව | දුටු + ව් + අ |
| | | දුටු + ව් + එන් |
| | | දුටුවෙන් (දක්නා කල) |

සීගිරි පද්‍යවල හමුවන විශේෂ පදයක් වශයෙන් දුදුට් යන අසම්භාව්‍ය ක්‍රියා පදය දැක්විය හැකිය. මධ්‍ය ඉන්දු ආර්ය භාෂාවන්හි මෙම පදයෙහි නිරුක්තිය (දුර් + දෘෂ්ට) යන්නයි. මෙහි අදහස නොමනා ලෙස දක්නා ලද කල්හි යන්නයි. මෙහි පූර්ව සර්ගයක් එකතු වී ඇත.

දක් > දට > දුට > දුට්

දුදුට් (දුර් + දෘෂ්ට) - දු + දුට්

මින් පැහැදිලි වනුයේ අතීත කෘදන්ත පද මෙම අවධියේ දී අසම්භාව්‍ය ක්‍රියා අර්ථයෙහි භාවිත වී ඇති බවයි.

- **-ය / -හි සර්ගය භාවිතය**

අසම්භාව්‍ය ක්‍රියා පදය පදිම පි හි ටීම අර්ථය පද්‍යය අංකය

| අසම්භාව්‍ය ක්‍රියා පදය | පදිම පිහිටීම | අර්ථය | පද්‍යය අංකය |
|---|---|---|---|
| දටය | dat̪ə + j | කාලාර්ථය | 626 |
| සිතිය | siti + jə | කාලාර්ථය | 34 |
| නටිහි | nat̪ + hi | කාලාර්ථය | 385 |

ඉහත පදවල සංස්ථිතික ලක්ෂණ සහිත ක්‍රියා පද පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, වර්තමාන කාල ප්‍රථම පුරුෂ හා මධ්‍යම පුරුෂ ඒකවචන යන ක්‍රියාර්ථ කිහිපයක් දැක්වීමෙහිලා ද භාවිත වී තිබේ. පහත නිදසුන් මගින් එය පැහැදිලි කරගත හැකි වේ.

- **පූර්ව ක්‍රියා, වර්තමාන කාල ප්‍රථම හා මධ්‍යම පුරුෂ ඒකවචන, අසම්භාව්‍ය ක්‍රියා**

නිදසුන් - මහනෙල්වනින් එ ක දටය මෙ මෙ හෙළිල්ලබු...

(මහනෙල්වන් තැනැත්තියෙනි ඔහු තොප දැක කවර තැනැත්තිය මේ රූමතිය මැයි

කියයි ද?)

අසය අ මුන් මෙ සිත් මෙ සෙය් ඇත පවත්නන්...

(සිත් රිසි සේ පවතින අය මෙහි ඇතැයි අසා මේ ජනයා මේ ගලට පැමිණි බඳුය)

....වුයූ යහ වෙයෙ දැයි වහය නිලස් වැ ඇස් හමුයුක්

(ඕ තොමො ඇස් හමුවට ආ කුමක් වුව නො ලස් වැ ගනියි)

මෙ රන්වන් තමා මනා එක් කෙනෙක් නටිහි...

(තමහට ආලය කළ කෙනෙකුන් නැසී ගිය කල.....)

වනවූ හිමින් හිමබි යැ යි හෙ සිතිය තමා......

(ස්වාමියාගෙන් වෙන් වූ කතුන් තමගේ යැය් සිතූ විට.....)

මේ අනුව පැහැදිලි වනුයේ -ය සහ -හි යන සර්ග සහිත, ඉහත දක්වා ඇති සංස්ථිතියෙන් යුක්ත ක්‍රියා පද විවිධ ක්‍රියා

අර්ථ දැක්වීම සඳහා එකල සිංහල භාෂාවේ භාවිත වී ඇති බවයි. එනම් වාක්‍යයක සමාප්ති වාචක ක්‍රියා හෙවත් වර්තමාන කාල ප්‍රථම පුරුෂ හා මධ්‍යම පුරුෂ ඒකවචනාර්ථයෙහිත්, පූර්ව ක්‍රියාර්ථයෙහිත්, අසම්භාව්‍ය ක්‍රියාර්ථයෙහිත් යෙදී ඇත.

### 6.5 සිංහල භාෂා පරිණාමීය ලක්ෂණ

මෙම අධ්‍යයනය මගින් සිංහල භාෂාවේ පරිණාමීය ලක්ෂණ කිහිපයක් හඳුනාගත හැකිය. මෙහි දී හඳුනාගත් විශේෂ ලක්ෂණයක් නම් භාෂාවක යම් ලක්ෂණයක් පරිණාමයට ලක් වූ පසු පැරණි ස්වරූපය ක්‍රමයෙන් ඉවත් වන අතර නව්‍ය රූපය භාෂාවේ ශේෂ වීමයි. එහෙත් සීගිරි පද්‍යය තුළ විශේෂත්වය නම් මෙම ස්වරූප කිහිපයම දැකිය හැකි වීමයි. එවැනි ලක්ෂණ කිහිපයක් පහත පරිදි දැක්විය හැකිය.

- **පදාන්ත හලන්ත භාවිතය**

සිංහල භාෂා පරිණාමයේ දී ක්‍රි. පූ 03වන සියවසයේ සිට ක්‍රි. ව. 07වන සියවස දක්වා යම් පදයක පදාන්ත හලන්ත ශබ්ද නොමැති වීමයි. නමුත් ක්‍රි. ව. 08වන සියවසයෙහි ආරම්භයත් සමඟ මෙම තත්වය ක්‍රමයෙන් වෙනස්ව තිබීමත් සීගිරි පද්‍යය මගින් අනාවරණය කරගත හැකිය. එනම් මෙම අවධියේ පටන් සිංහල භාෂාවේ පදාන්ත ඇතැම් ශබ්දිමවල අන්ත ස්වර ශබ්දිම අභාවයට ගොස් ඇත. එම ලක්ෂණය හේතුවෙන් පදාන්ත හලන්ත ශබ්ද ඇතිව තිබේ.

උදා - බණතුද්

දක්තුජ්

වසත්හොත්

බැලුයොත්

දුටොත්

බලයේ

- **අභිශ්‍රැතියේ ලක්ෂණ ඇතිවීම**

අභිශ්‍රැතියේ පළමු පියවර වශයෙන් සැලකෙනුයේ -එ- යන්න යෙදීම හා එහි දෙවන පියවර වශයෙන් -එ ස ඇ බවට පත්වීමයි. මෙම ලක්ෂණ දෙකම සහිත පද සීගිරි පද්‍යය තුළ අන්තර්ගත වේ.

උදා - බණ > බෙණෙ > බැණැ

කර > කෙරෙ > කැරැ

බල > බෙලූ > බැලූ

- **නාසිකීකෘත ස්පර්ශ ශබ්ද**

මෙතෙක් සිංහල භාෂාවේ නොවූ බිංදුව, වර්ගාන්තානුනාසික සංයුක්ත ව්‍යඤ්ජන හා නාසිකීකෘත ස්පර්ශ ශබ්ද දක්නට ලැබීම.

උදා - සන්ද

- සන්ද්

- සන්දැ

- සඳ

- **ජ > ද වීම**

සිංහල භාෂාවේ පූර්ව අවධියෙහි ස්වර මධ්‍යගත -ජ්- ශබ්දය යෙදුණු අතර පසුව එම ලක්ෂණය අභාවයට ගොස් ඒ සඳහා -ද්- ආදේශ විය. (-ජ්- ස -ද්-) මෙම ලක්ෂණය සිංහල භාෂා පරිණාමයෙහි අවස්ථා දෙකක් නියෝජනය කරනු ලැබේ. එහෙත් සීගිරි පද්‍යය තුළ මෙම භාෂා ලක්ෂණ දෙකම සහිත යෙදුම් හමු වේ.

උදා :- වසතුජ් > වසතුද්

දක්තුජ් > දක්තුද්

බලතුජ් > බලතුද්

මෙහි තුන්වන පරිණාමීය ලක්ෂණය නම් පදාන්තව යෙදෙන ඝෝෂ ස්පර්ශ ශබ්දිමය

අසෝසීකරණයට ලක්වීමයි.

උදා :- බලතුද් > බලත්

දක්තුද් > දකුත්

වසතුද් > වසත්

මේ ආදි වශයෙන් මෙම අධ්‍යයනය මගින් සිංහල භාෂාවේ පරිණාමීය ලක්ෂණ රැසක් හඳුනාගත හැකිය. භාෂාවේ යම් පූර්ව අවධියක වෙනස් වූ ලක්ෂණ ද මෙහි අන්තර්ගත වනුයේ මන්ද යන්න විමර්ශනයට ලක් කළ යුතු කරුණකි. ඉන් අනුමාන කළ හැකි එක් කරුණක් නම් මෙම සීගිරි පද්‍යය ලියූවන් අතරට උගත්, නූගත් සියලුම පාඨකයන් අයත් වේ. මොවුන් විවිධ පළාත් නියෝජනය කරනු ලැබේ. ඒ අනුව ඒ ඒ ප්‍රදේශවල මෙම ලක්ෂණ භාවිත කරන්නට ඇති නමුත් එම භාෂා විවිධත්වය මෙමගින් ප්‍රකට වේ යන්න අනුමාන කළ හැකිය. එය තවදුරටත් ශාස්ත්‍රීය අන්දමින් විමසුමට ලක්කළ යුතු කරුණකි.

## 7. නිගමනය හා සමාලෝචනය

සීගිරි පද්‍යවල අන්තර්ගත අසම්භාව්‍ය ක්‍රියා රූප සාධනය සඳහා භාවිත ක්‍රම කිහිපයක් හඳුනාගත හැකිය. එනම්,

- සර්ග භාවිතය
- උපපද යෝගය
- කෘදන්ත පද භාවිතය
- වෙනත් විශේෂතා

සර්ග භාවිතය සැලකූ කල -ත සහ -ත් යන ප්‍රත්‍යය භාවිතයෙන් සිංහල භාෂාවට ක්‍රමිකව අසම්භාව්‍ය ක්‍රියාරූප සකසාගෙන තිබේ. එහිලා ධාතු ප්‍රකෘතියෙහි විවිධ ස්වර විපර්යාස සිදු කරමින් මෙම ප්‍රත්‍යය එකතු වී තිබීම, ධාතුවටත් ප්‍රත්‍යයටත් අතරට -ව- යන ව්‍යුත්පන්න සර්ගය යොදා අසම්භාව්‍ය ක්‍රියාරූප සකසා ගැනීම වැනි ක්‍රම භාවිතයෙන් අසම්භාව්‍ය ක්‍රියාපද සාධනය වී තිබේ. විශේෂයෙන් මෙම ප්‍රත්‍යය යෝග යෙන් කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාරූප සැකසී ඇත. සීගිරි පද්‍යවල යෙදෙන දත්ත අනුව අසම්භාව්‍ය ක්‍රියාපද සඳහා උපපද භාවිතය බහුලව දැකිය හැකි ලක්ෂණයකි. මෙම උපපද කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාර්ථ මෙන්ම අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාර්ථ දැක්වීම සඳහා භාවිත කොට ඇත. කෘදන්ත පද භාවිතයෙන් අසම්භාව්‍ය ක්‍රියාර්ථය හඟවන පද සීගිරි පද්‍යය තුළ අන්තර්ගත වේ. මෙහි දී අතීත කෘදන්ත හා වර්තමාන කෘදන්ත යන දෙවර්ගයම මේ සඳහා භාවිත කොට ඇත. මෙහි දී කෘදන්ත පදය හා -අ, -ඉ ප්‍රත්‍යය අතරට -ච්-, -ය්- යන ව්‍යුත්පන්න සර්ග යෙදීමක් හඳුනාගත හැකිවිය. තවද අතීත කෘදන්ත පද අග ඇති -අ සර්ගයට -එන් යන විශේෂ අපර සර්ගය යෙදුණු අසම්භාව්‍ය ක්‍රියාපද දක්නට ලැබීම හා ධාතු ප්‍රකෘතිය පමණක් අසම්භාව්‍ය ක්‍රියාර්ථයේ භාවිත වීම. මෙහි දී අසම්භාව්‍ය ක්‍රියාර්ථ ප්‍රකාශ කිරීම සඳහා ධාතු ප්‍රකෘතියට පරව -ය සහ -හි යනුවෙන් විශේෂ අපර සර්ග දෙකක් භාවිත වේ. මෙම සංස්ථිතියෙන් යුක්ත පදවල විශේෂත්වය වනුයේ ඒවා තවත් ක්‍රියා ප්‍රයෝගවල යෙදීමයි. එවිට යම් වාක්‍යයක යෙදෙන ප්‍රකරණය අනුව කුමන ව්‍යාකරණ ප්‍රවර්ග යට අයත් දැයි නිශ්චය කරනු ලැබේ. මේ අනුව පැහැදිලි වනුයේ සීගිරි පද්‍යය තුළ යෙදෙන අසම්භාව්‍ය ක්‍රියාපදවල විවිධ විශේෂතා රැසක් හඳුනාගත හැකි බවයි. සමකාලීන සාහිත්‍යය කෘතිවල එන ඇතැම් පොදු ලක්ෂණ අන්තර්ගත වුවද අසම්භාව්‍ය ක්‍රියාව සම්බන්ධ වෙනත් විශේෂ ලක්ෂණ රැසක් මින් අනාවරණය කරගත හැකිය. ඊට අමතරව සිංහල භාෂාවේ ඉතිහාසය සම්බන්ධ පරිණාමීය ලක්ෂණ කිහිපයක් ද මින් අනාවර්ණිතය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

කරුණාතිලක, ඩබ්. එස්. (2014). සිංහල භාෂා ව්‍යාකරණය. කොළඹ: ඇම්. ඩී ගුණසේන සහ සමාගම.

කරුණාතිලක, ඩබ්ලිව්. එස්. (2006). ඓතිහාසික වාග්විද්‍යා ප්‍රවේශය. කොළඹ: එස් ගොඩගේ සහ සහෝදරයෝ.

ගම්ලත්, එස්. (2000) සීගිරි කුරුටු ගී. කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

දිසානායක, ජේ. බී. (2001). බසක මහිම 11 - ක්‍රියා පදය. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ධම්මසේන, ඩබ්. (1982). අමාවතුරේ ක්‍රියාපද පිළිබඳ පදිම විග්‍රහයක්. (ශාස්ත්‍රවේදී උපාධි නිබන්ධනය). කැලණිය විශ්වවිද්‍යාලය.

ධර්මාරාම, ආර්. (1947). සිදත් සඟරා විස්තර සන්නය. පෑලියගොඩ: විද්‍යාලංකාර මුද්‍රණාලය.

පේමානන්ද, පී. (2004). සිංහල භාෂාවේ පරිණාමය හා සිදත් සඟරාව. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

මුදියන්සේ, එන්. (2004) සීගිරි පද්‍යාවලි. දෙවන මුද්‍රණය. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

මුනිදාස, කේ. (2022). ක්‍රියා විවරණය. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

විල්හෙල්ම්, ජී. (2005). සිංහල භාෂා ව්‍යාකරණය. කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

වීරවර්ධන, වී. ඒ. (2011). බුත්සරණේ ක්‍රියාපද පිළිබඳ වාග්විද්‍යාත්මක විග්‍රහයක්. (දර්ශනපති උපාධි නිබන්ධනය). කැලණිය විශ්වවිද්‍යාලය.

සෝමාලෝක, කේ. (2014). සිදත්සඟරා වියරණ විමසුම. කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

සෝරත, ඩබ්. (1999). සුමංගල ශබ්දකෝෂය. ප්‍රථම භාගය. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සෝරත, ඩබ්. (1999). සුමංගල ශබ්දකෝෂය. ද්විතීය භාගය. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Gunasekara, A. M. (2008). Comprehensive Grammar of the Sinhalese Language. Colombo: S. Godage & Brothers (Pvt) Ltd.

Karunatillake, W. S. (2012). Etymological lexicon of the Sinhala language. Colombo: S. Godage & Brothers (Pvt) Ltd.

Paranavitana, S. (1956). Sigiri Graffiti: Being Sinhalese Verses of the Eighth, Ninth, and Tenth Centuries. Vol I. London: Oxford University Press for the Archaeological Survey of Ceylon.

Paranavitana, S. (1956). Sigiri Graffiti: Being Sinhalese Verses of the Eighth, Ninth, and Tenth Centuries. Vol II. London: Oxford University Press for the Archaeological Survey of Ceylon.